# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1998 අංක 40 දරන වෛද්‍ය (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 1998 ජුනි මස 26 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 ජුනි මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 9.00 යි. තැපැල් ගාස්තුව : රු. 2.50 යි.

# 1998 අංක 40 දරන වෛද්‍ය (සංශෝධන) පනත

එල්.ඩී.–ඕ. 65/94

[සහතිකය සටහන් කළේ 1998 ජුනි මස 26 වැනි දින]

**වෛද්‍ය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 1998 අංක 40 දරන වෛද්‍ය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

105 වන අධිකාරයේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින් මතු 'ප්‍රධාන ප්‍රඥප්තිය' යනුවෙන් සඳහන් කරනු ලබන) වෛද්‍ය ආඥාපනතේ 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) 'ලංකා වෛද්‍ය සභාව' යන ශීර්ෂය වෙනුවට 'ශ්‍රී ලංකා වෛද්‍ය සභාව' යන ශීර්ෂය ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (මෙම ආඥාපනතේ 'වෛද්‍ය සභාව' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා වෛද්‍ය සභාව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :–" යන වචන වෙනුවට "වෛද්‍ය සභාව ඒ ආකාරයෙන් එය විසින් සහ ඊට විරුද්ධව නඩු පැවරීමට සහ චංචල සහ නිශ්චල දේපළ අත් කර ගැනීමට හා දැරීමට බලය සහිතව අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති (මෙහි මින් මතු 'වෛද්‍ය සභාව' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා වෛද්‍ය සභාව යන නාමයෙන් සහ අභිධානයෙන් යුත් සංස්ථාවක් විය යුතු අතර එය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:–" යන වචන ආදේශ කිරීමෙන්

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි (ඉ) ඡේදයෙහි "සුදුසුකම් ලත් තැනැත්තන් පිළිබඳ ලේඛනයක් ; සහ" යන වචන වෙනුවට "සුදුසුකම් ලත් තැනැත්තන් පිළිබඳ ලේඛනයක් ;"යන වචන ආදේශ කිරීමෙන් ;

(2) (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

2–ඩී 048911–5,900 (98/04)

"(ඉඉ) වෛද්‍ය විද්‍යාවට පරිපූරක වෘත්තියක සාමාජිකයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට සුදුසුකම් ලත් තැනැත්තන් පිළිබඳ ලේඛනයක් ; සහ ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි (1) වන උපවගන්තියෙහි (ඇඇඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඇඇඇඇ) වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ වෘත්තියෙහි යෙදීමේ හිමිකම් ඇති තැනැත්තකු වශයෙන් මේ වගන්තියේ (2ආආ) උපවගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇත්තා වූ ද, ඒ උපවගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන ලේඛනයෙහි තම නම තත්කාලයේ ඇතුළත්ව ඇත්තා වූ ද යම් වතු ඇපොතිකරිවරයෙක් ; " ;

(2) ඒ වගන්තියේ (2අ) උපවගන්තියෙහි "යටත් පිරිසෙයින් සම්පූර්ණයෙන් අවුරුදු පහළොවක් වූ කාලසීමාවක්" යන වචන යෙදෙන කවර වූ හෝ ස්ථානයක ඒ වෙනුවට "යටත් පිරිසෙයින් සම්පූර්ණයෙන් අවුරුදු අටක් වූ කාල සීමාවක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (2ආ) උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(2ආආ) (අ) වත්තක හෝ වතු සමූහයක සේවානියුක්තියේ යෙදී සිටින නැතහොත් එකී සේවානියුක්තිය අවසන් වී තිබෙන යම් වතු ඇපොතිකරිවරයකු විසින්—

(i) තමා වතු ඇපොතිකරිවරයකු වශයෙන්, යටත් පිරිසෙයින් සම්පූර්ණයෙන් අවුරුදු හතරක් වූ කාලසීමාවක් තුළ කාර්යක්ෂම හා සතුටුදායක සේවයක් කර ඇති බවට ;

(ii) තමා, ඒ කාලසීමාව තුළ සම්පූර්ණයෙන් අවුරුදු තුනක් වූ කාලසීමාවක් වෛද්‍ය වෘත්තිකයකු වූ එක් අයකු හෝ ඊට වැඩි ගණනක් යටතේ ආරෝග්‍යශාලා එකක හෝ ඊට වැඩි ගණනක සේවය කර ඇති බවට ; සහ

(iii) තමා විද්‍යාල සභාවෙන් පිරිනමන ලද අභිඥාන පත්‍රයක් දරන බවට

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වන ලෙස සාධක ඉදිරිපත් කරන ලද විට සහ නියමිත ගාස්තුව ගෙවන ලද විට, වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ වෘත්තියෙහි යෙදීමට හිමිකම් ලැබෙන පරිදි රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ වතු ඇපොතිකරිවරයා ලියාපදිංචි කළ හැකි ය.

(ආ) මේ උපවගන්තිය යටතේ ලියාපදිංචි කළ තැනැත්තන්ගේ ලේඛනයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් පවත්වාගෙන යා යුතු අතර, මේ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ මකා දමනු ලැබිය යුතු බවට වෛද්‍ය සභාව විසින් නියම කරන ලද යම් තැනැත්තකුගේ නම ඉන් මකා දැමිය යුතු ය. ";

(4) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි—

(අ) "යම් තැනැත්තකු හෝ (1) (ඇඇ) වන උපවගන්තිය යටතේ" යන වචන වෙනුවට "යම් තැනැත්තකු හෝ (1) (ඇඇ) වන උපවගන්තිය යටතේ හෝ (1) (ඇඇඇඇ) වන උපවගන්තිය යටතේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) "2 (ආ) වන උපවගන්තිය යටතේ" යන වචන වෙනුවට "2(ආ) වන උපවගන්තිය යටතේ හෝ 2 (ආආ) වන උපවගන්තිය යටතේ" යන වචන ආදේශ කිරීමෙන්.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 60අ වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) යන ඡේද ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 60අ වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 60ආ වන වගන්තිය, ඒ වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) උපවගන්ති ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 60ආ වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ VIIIඅ වන අලුත් කොටස ඇතුළත් කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ VIIIඅ වන කොටසට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් කොටස ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ VIIIඅඅ වන කොටස ලෙස බලපැවැත්විය යුතු ය.

## VIIIඅඅ වන කොටස

### වෛද්‍ය විද්‍යාවට පරිපූරක වගන්ති

වෛද්‍ය විද්‍යාවට පරිපූරක වෘත්තිවල සාමාජිකයන්ගේ ලේඛනය.

60ඊ. 20 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉඉ) ඡේදය යටතේ වූ වෛද්‍ය විද්‍යාවට පරිපූරක වෘත්තියක සාමාජිකයන් ලෙස ලියාපදිංචි කරනු ලැබ ඇති තැනැත්තන් පිළිබඳ ලේඛනය පහත දැක්වෙන පරිදි වෙන් වූ කොටස්වලින් සමන්විත විය යුතු ය :—

(අ) විකිරණ ශිල්පීන් වශයෙන් ලේඛනයට ඇතුළත් කරනු ලැබූ සියලු තැනැත්තන්ගේ නම් "අ" කොටසෙහි අඩංගු විය යුතු ය:

(ආ) වෛද්‍ය රසායනාගාර කාර්මිකඥයන් වශයෙන් ලේඛනයට ඇතුළත් කරනු ලැබූ සියලු තැනැත්තන්ගේ නම් "ආ" කොටසෙහි අඩංගු විය යුතු ය:

(ඇ) භෞත චිකිත්සකයින් වශයෙන් ලේඛනයට ඇතුලත් කරනු ලැබූ සියලු තැනැත්තන්ගේ නම් "ඇ" කොටසෙහි අඩංගු විය යුතු ය:

(ඈ) වෘත්තිය චිකිත්සකයින් වශයෙන් ලේඛනයට ඇතුළත් කරනු ලැබූ සියලු තැනැත්තන්ගේ නම් "ඈ" කොටසෙහි අඩංගු විය යුතු ය.

(2) වෛද්‍ය විද්‍යාවට පරිපූරක වෘත්තියක සාමාජිකයකු ලෙස ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීමේ දී ලියාපදිංචි කිරීම සඳහා වූ ගාස්තුව රෙජිස්ට්‍රාර්වරයාට ගෙවිය යුතු ය.

වෛද්‍ය විද්‍යාවට පරිපූරක වෘත්තිවල සාමාජිකයන්ගේ ලේඛනයට ඇතුළත් කිරීම සඳහා වූ සුදුසුකම්.

60උ. (1) (අ) යම් තැනැත්තකු මනා චරිතයකින් යුක්ත වන්නේ නම් සහ විද්‍යාල සභාව විසින් විකිරණ ශිල්පියකු වශයෙන් නිකුත් කරනු ලැබූ ප්‍රවීණතා සහතික පත්‍රයක් දරන්නේ නම්, ඔහු විකිරණ ශිල්පියකු වශයෙන් වෛද්‍ය විද්‍යාවට පරිපූරක වෘත්තියක සාමාජිකයන්ගේ ලේඛනයට ඇතුළත් කරනු ලැබීම සඳහා සුදුසුකම ලබන්නේ ය.

(ආ) යම් තැනැත්තකු මනා චරිතයකින් යුක්ත වන්නේ නම් සහ විද්‍යාල සභාව විසින් වෛද්‍ය රසායනාගාර කාර්මිකඥයකු වශයෙන් නිකුත් කරනු ලැබූ ප්‍රවීණතා සහතික පත්‍රයක් දරන්නේ නම්, ඔහු වෛද්‍ය රසායනාගාර කාර්මිකඥයකු වශයෙන් වෛද්‍ය විද්‍යාවට පරිපූරක වෘත්තියක සාමාජිකයන්ගේ ලේඛනයට ඇතුළත් කරනු ලැබීම සඳහා සුදුසුකම ලබන්නේ ය.

(ඇ) යම් තැනැත්තකු මනා චරිතයකින් යුක්ත වන්නේ නම් සහ විද්‍යාල සභාව විසින් භෞත චිකිත්සකයකු වශයෙන් නිකුත් කරනු ලැබූ ප්‍රවීණතා සහතික පත්‍රයක් දරන්නේ නම්, ඔහු භෞත චිකිත්සකයකු වශයෙන් වෛද්‍ය විද්‍යාවට පරිපූරක වෘත්තියක සාමාජිකයන්ගේ ලේඛනයට ඇතුළත් කරනු ලැබීම සඳහා සුදුසුකම ලබන්නේ ය.

(ඈ) යම් තැනැත්තකු මනා චරිතයකින් යුක්ත වන්නේ නම් සහ විද්‍යාල සභාව විසින් වෘත්තීය චිකිත්සකයකු වශයෙන් නිකුත් කරනු ලැබූ ප්‍රවීණතා සහතික පත්‍රයක් දරන්නේ නම්, ඔහු වෘත්තීය චිකිත්සකයකු වශයෙන් වෛද්‍ය විද්‍යාවට පරිපූරක වෘත්තියක සාමාජිකයන්ගේ ලේඛනයට ඇතුළත් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලබන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුව ද අවස්ථාවෝචිත පරිදි, විකිරණ ශිල්පියකු වශයෙන්, වෛද්‍ය රසායනාගාර කාර්මිකඥයකු වශයෙන්, භෞත චිකිත්සකයකු වශයෙන් හෝ වෘත්තීය චිකිත්සකයකු වශයෙන් සහාය වෛද්‍ය සහකාරයන් පිළිබඳ ලේඛනයට ඇතුළත් කරනු ලැබ ඇත්තා වූ ද ස්වකීය ලියාපදිංචි කිරීම මේ වගන්තිය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පැවතියා වූ ද තැනැත්තකු, අවස්ථාවෝචිත පරිදි, විකිරණ ශිල්පියකු වශයෙන්, වෛද්‍ය රසායනාගාර කාර්මිකඥයකු වශයෙන්, භෞත චිකිත්සකයකු වශයෙන් හෝ වෘත්තීය චිකිත්සකයකු වශයෙන් වෛද්‍ය විද්‍යාවට පරිපූරක වෘත්තියක සාමාජිකයන්ගේ ලේඛනයට ඇතුළත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

ලේඛනයෙන් සාමාජිකයකුගේ නම මකා දැමිය හැක්කේ කවර අවස්ථාවක දී ද යන වග.

60උ. මේ ආඥාපනත යටතේ වෛද්‍ය විද්‍යාවට පරිපූරක වෘත්තියක සාමාජිකයකු වශයෙන් නම ලියාපදිංචි කරනු ලැබූ යම් තැනැත්තකු—

(අ) වෛද්‍ය විද්‍යාවට පරිපූරක වෘත්තියක සාමාජිකයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබුවේ යම් සහතික පත්‍රයක් මත ද, ඒ සහතික පත්‍රය ඔහුට අහිමි කරනු ලැබිණි නම්; හෝ

(ආ) වෛද්‍ය විද්‍යාවට පරිපූරක වෘත්තියක සාමාජිකයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට නුසුදුසු බව දක්වන ආකාරයේ වරදකට වරදකරු කරනු ලැබිණි නම් : හෝ

(ඇ) වෛද්‍ය විද්‍යාවට පරිපූරක වෘත්තියක සාමාජිකයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඔහුට නිර්භයව ඉඩ දිය නොහැකි වන සේ වෛද්‍ය විද්‍යාවට පරිපූරක වෘත්තියක සාමාජිකයකු වශයෙන් නොසැලකිල්ලක් හෝ අසමත්කමක් දක්වන්නේ නම් : හෝ

(ඈ) වෘත්තියේ යෙදීමේ දී යම් ආකාරයකින් අපකීර්තිමත් පැවැත්ම සම්බන්ධ වරදක් කර තිබේ නම්

ඔහුගේ නම වෛද්‍ය විද්‍යාවට පරිපූරක වෘත්තියක සාමාජිකයන්ගේ ලේඛනයෙන් මකා දැමිය හැකි ය.

වෛද්‍ය විද්‍යාවට පරිපූරක වෘත්තියක සාමාජිකයකු බවට නීති විරෝධී ලෙස ව්‍යාජ නිරූපණය.

60ඵ. (1) වෛද්‍ය විද්‍යාවට පරිපූරක වෘත්තියක ලියාපදිංචි වූ සාමාජිකයකු නොවන කිසිම තැනැත්තකු විසින් ලියාපදිංචි වූ වෛද්‍ය විද්‍යාවට පරිපූරක වෘත්තියක සාමාජිකයකු වශයෙන් තමා මේ ආඥාපනත යටතේ ලියාපදිංචි වී ඇති බව අඟවන යම් නමක්, අභිධානයක් හෝ විස්තරයක් භාවිත නොකළ යුතු ය.

(2) වෛද්‍ය විද්‍යාවට පරිපූරක වෘත්තියක සාමාජිකයන්ගේ ලේඛනයේ යම් කොටසක තම නම ඇතුළත් කරනු ලැබූ කිසිම තැනැත්තකු විසින් ඇත්ත වශයෙන් ම, ඒ තැනැත්තාගේ නම ඒ ලේඛනයේ වෙනත් යම් කොටසක ඇතුළත් කර නොමැති වුවද එසේ ඇතුළත් කර ඇති බව අඟවන යම් නමක්, අභිධානයක් හෝ විස්තරයක් භාවිත කිරීම හෝ වෙනත් යම් ක්‍රියාවක් කිරීම හෝ නොකළ යුතු ය.

සුදුසුකම් නොලත් තැනැත්තකු වෛද්‍ය විද්‍යාවට පරිපූරක වෘත්තියක සාමාජිකයකු වශයෙන් වෘත්තියේ යෙදීම තහනම් කිරීම.

60ම. වෛද්‍ය විද්‍යාවට පරිපූරක වෘත්තියක ලියාපදිංචි වූ සාමාජිකයකු නොවන කිසිම තැනැත්තකු විසින් වෛද්‍ය විද්‍යාවට පරිපූරක වෘත්තියක ලියාපදිංචි වූ සාමාජිකයකු වශයෙන් ලාභ පිණිස වෘත්තියේ යෙදීම හෝ වෘත්තියේ යෙදෙන බව ප්‍රසිද්ධියේ කියා පෑම හෝ වෘත්තියේ යෙදෙන බවට තම නම ප්‍රචාරය කිරීම හෝ නොකළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තියේ "රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට" යන වචන වෙනුවට "රුපියල් පන්දහසකට අඩු නොවන සහ රුපියල් පණස් දහසක් නොඉක්මවන දඩයකට සහ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක සිර දඬුවමකට සහ දෙවන වරට හෝ අනතුරුව වරද කරනු ලබන විට, රුපියල් දස දහසකට අඩු නොවන සහ රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට සහ මාස දොළහක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක සිර දඬුවමකට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 69අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියෙහි 69අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :-

"රාජ්‍යය සන්තක කිරීම.

69අ. (1) මේ ආඥාපනත යටතේ වූ වරදක් සඳහා යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ පසු, වරද කිරීමට හෝ එහිදී භාවිත කරනු ලැබූ හෝ ඊට සම්බන්ධකමක් ඇති යම් භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් රාජ්‍යය සන්තක විය යුතු යයි අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවකින් රාජ්‍යය සන්තක කරන ලද යම් දේපළක් කොන්දේසි රහිතව රාජ්‍යය සතු විය යුතු ය. එවැනි සතුවීමක්—

(අ) රාජ්‍යය සතු කිරීමේ ආඥාවකට විරුද්ධව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයක් වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක, ඒ රාජ්‍යය සතු කිරීමේ ආඥාවට විරුද්ධව වූ අභියාචනය ඒ මහාධිකරණය වෙත ඉදිරිපත් කළ යුතුව තිබුනු කාලය ඉක්මවා ගිය විට ;

(ආ) ඒ රාජ්‍යය සතු කිරීමේ ආඥාවට විරුද්ධව මහාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරන ලදුව ඒ රාජ්‍යය සතු කිරීම තහවුරු කරමින් හෝ ස්ථිර කරමින් ඒ මහාධිකරණය විසින් කරන ලද ආඥාවට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර නැති අවස්ථාවක, ඒ මහාධිකරණයේ ආඥාවට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතුව තිබුනු කාලය ඉක්මවා ගිය විට ;

(ඇ) ඒ රාජ්‍යය සතු කිරීමේ ආඥාවට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් කරන ලද අවස්ථාවක, ඒ රාජ්‍යය සතු කිරීමේ ආඥාව තහවුරු කරමින් හෝ ස්ථිර කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණයක් කරනු ලැබූ විට

ක්‍රියාත්මක විය යුතු ය.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනයෙන් පහත දැක්වෙන කොටස් අත්හැර දැමීමෙන් එම උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) "විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලබන විකිරණ ශිල්පියකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රයක් ඉල්ලුම්කරු දරන අවස්ථාවක" යන ශීර්ෂය යටතේ වූ ප්‍රකාශය :

(2) "විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබූ වෛද්‍ය රසායනාගාර කාර්මිකඥයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රයක් ඉල්ලුම්කරු දරන අවස්ථාවක" යන ශීර්ෂය යටතේ වූ ප්‍රකාශය :

(3) "විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබූ භෞත චිකිත්සකයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රයක් ඉල්ලුම්කරු දරන අවස්ථාවක" යන ශීර්ෂය යටතේ වූ ප්‍රකාශය :

(4) "විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබූ වෘත්තීය චිකිත්සකයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රය ඉල්ලුම්කරු දරන අවස්ථාවක" යන ශීර්ෂය යටතේ වූ ප්‍රකාශය.

11. ප්‍රධාන ප්‍රඥප්තිය අගට පහත දැක්වෙන අලුත් උපලේඛනයක් එකතු කිරීමෙන් ඒ ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් උපලේඛනයක් එකතු කිරීම.

"හත්වන උපලේඛනය"

**වෛද්‍ය විද්‍යාවට පරිපූරක වෘත්තියක සාමාජිකයකු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා වූ ප්‍රකාශය**

විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලබන විකිරණ ශිල්පියකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රයක් ඉල්ලුම්කරු දරන අවස්ථාවක—

(ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය) වන මම මෙයින් මෙසේ ප්‍රකාශ කරමි :—

විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබ, දැනට ඉදිරිපත් කොට මට පෙන්වනු ලැබූ සහ "අ" සළකුණු කරනු ලැබ ඇති, විකිරණ ශිල්පියකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රයක් (නම) යනුවෙන් නම් කරන ලද තැනැත්තා මම වෙමි.

ඉල්ලුම්කරුගේ අත්සන.

වර්ෂ ක් වූ මස වන දින දී ය.

වර්ෂ ක් වූ මස වන දින වූ මෙදින මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

(ප්‍රකාශය ගන්නා තැනැත්තාගේ අත්සන) (සමාදාන විනිශ්චයකාර හෝ දිවුරුම් කොමසාරිස්)

විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබූ වෛද්‍ය රසායනාගාර කාර්මිකඥයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රයක් ඉල්ලුම්කරු දරන අවස්ථාවක.

(ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය) වන මම මෙයින් මෙසේ ප්‍රකාශ කරමි :—

විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබ, දැනට ඉදිරිපත් කොට මට පෙන්වනු ලැබූ සහ "අ" සළකුණු කරනු ලැබ ඇති, වෛද්‍ය රසායනාගාර කාර්මිකඥයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රයේ (නම) යනුවෙන් නම් කරන ලද තැනැත්තා මම වෙමි.

ඉල්ලුම්කරුගේ අත්සන.

වර්ෂ ක් වූ මස වන දින දී ය.

වර්ෂ ක් වූ මස වන දින වූ මෙදින මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

(ප්‍රකාශය ගන්නා තැනැත්තාගේ අත්සන)

(සමාදාන විනිශ්චයකාර හෝ දිවුරුම් කොමසාරිස්)

විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබූ භෞත චිකිත්සකයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රයක් ඉල්ලුම්කරු දරන අවස්ථාවක.

(ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය) වන මම මෙයින් මෙසේ ප්‍රකාශ කරමි :—

විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබ, දැනට ඉදිරිපත් කොට මට පෙන්වනු ලැබූ සහ "අ" සළකුණු කරනු ලැබ ඇති, භෞත චිකිත්සකයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රයේ (නම) යනුවෙන් නම් කරන ලද තැනැත්තා මම වෙමි.

ඉල්ලුම්කරුගේ අත්සන.

වර්ෂ ක් වූ මස වන දින දී ය.

වර්ෂ ක් වූ මස වන දින වූ මෙදින මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

(ප්‍රකාශය ගන්නා තැනැත්තාගේ අත්සන)

(සමාදාන විනිශ්චයකාර හෝ දිවුරුම් කොමසාරිස්)

විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබූ වෘත්තීය චිකිත්සකයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රයක් ඉල්ලුම්කරු දරන අවස්ථාවක.

(ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය) වන මම මෙයින් මෙසේ ප්‍රකාශ කරමි :—

විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබ, දැනට ඉදිරිපත් කොට මට පෙන්වනු ලැබූ සහ "අ" සළකුණු කරනු ලැබ ඇති, වෘත්තීය චිකිත්සකයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රයේ (නම) යනුවෙන් නම් කරන ලද තැනැත්තා මම වෙමි.

ඉල්ලුම්කරුගේ අත්සන.

වර්ෂ ක් වූ මස වන දින දී ය.

වර්ෂ ක් වූ මස වන දින වූ මෙදින මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

(ප්‍රකාශය ගන්නා තැනැත්තාගේ අත්සන)

(සමාදාන විනිශ්චයකාර හෝ දිවුරුම් කොමසාරිස්)

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**12.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.